ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date. 2026.01.20

01. ආර්. ගනේෂ්වරන් මයා
නො.12 3/1, කැස්ටල් වීදිය,
බම්බලපිටිය.

*පැමිණිලි පාර්ශවය*

*එදිරිව*

01. විභාග කොමසාරිස් ජනරාල්
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත, බත්තරමුල්ල.

02. ඒ. හේමානන්ත් මයා
ශාලාධිපති,
මධ්‍යස්ථාන අංක 0108.
මෙතෝදිස්ත විද්‍යාලය, කොළඹ.

*වගඋත්තර පාර්ශවය*

**<u>පැමිණිලි අංක : HRC/HO/1915/24</u>**

ආර්. ගනේෂ්වරන් මහතා විසින් ඉහත පැමිණිලි අංක යටතේ 2024.05.14 දිනැතිව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පහත පරිදි පැමිණිල්ලක් යොමුකර ඇත. තමාගේ වයස අවුරුදු 18 ක් වූ ගජේන්ඩා ගනේශ්වරන් යන දියණිය, කොල්ලුපිටියේ පිහිටි මෙතෝදිස්ත පාසලේ පළමු ශ්‍රේණියේ සිට එකොළහ ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය හදරණ බව ප්‍රකාශ කර තිබේ. 2024 වසරේදී පවත්වන ලද (2023/2024) අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයට මුහුණ දීමට සිටි බැවින්, ඒ සඳහා විශේෂ අවශ්‍යතා සහිත දරුවෙක් ලෙස අයදුම් කර ඇති බව සඳහන් කර තිබේ. තම දියණිය පාසලේ විශේෂ අධ්‍යාපන

ඒකකයේ 2012 වසරේ සිට අධ්‍යාපනය ලබන බවත් රිජ්වේ ආර්යා ළමා රෝහල මගින් 2019 වර්ෂයේ දී පසුගාමී වර්ධනයක් සහිත සහ සෙමෙන් මනස වැඩෙන දරුවෙකු බව හඳුනාගෙන ඇති බවත් 2024 වසරේ දී පසුගාමී සඳහා ජාතික මධ්‍යයස්ථානය විසින් තම දියණිය ඉගෙනුම් දුබලතා සහිත දැරියක් බවට විනිශ්චය කර ඇති බවත් සඳහන් කර ඇත. 2017 වසරේ දී ලබාදුන් වෛද්‍ය නිර්දේශ මත ඉංග්‍රීසි, හින්දු ධර්මය, දෙමළ සහ සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය යන විෂයන් වලට පමණක් 2023(2024) පැවති අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටීමට සිටි බවත්, පසුගිය වසර දෙක තුළ පාසලේදී පෙනී සිටි සෑම වාර විභාගයක දීම පාසල මගින්, සෑම විෂයක් සඳහා ම පැය 1 ට විනාඩි 10 බැගින් අමතර කාලයක් ලබාදීම, නිදහස් නිශ්ශබ්ද සාමකාමී විභාග පරිසරයක් සහිත විභාග කාමරයක් ලබාදීම, ප්‍රශ්න කියවීම සහ දරුවා ලබාදෙන පිළිතුරු ලිවීමට ගුරුවරු පත් කිරීම යන සහන ලබාදුන් බව සඳහන් කර ඇත.

තමාගේ දියණිය විශේෂ අවශ්‍යතා සහිත දරුවෙක් වන බැවින්, සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටීම සඳහා මේ පිළිබඳව සඳහන් කරමින් විදුහල්පතිනිය මාර්ගයෙන් අයදුම් කළ බවත්, ඒ අනුව 2024.04.09 වන දින විශේෂ අවශ්‍යතා සහිත ළමුන්ට සහන සැලසීම සඳහා පවත්වන ලද සම්මුඛ පරීක්ෂණය සඳහා දියණියගේ පියා සමග දියණිය සහභාගී වූ බවත් සඳහන් කර ඇත. එම සම්මුඛ පරීක්ෂණය කොළඹ අධ්‍යාපන කලාප කාර්යාලයේ පවත්වන ලද බවත් දියණිය විභාගයට පෙනී සිටින මාධ්‍ය දෙමළ භාෂාව වුව ද සම්මුඛ පරීක්ෂණය සිංහල භාෂාවෙන් පමණක් පවත්වන ලද බව පැමිණිලිකරු විසින් ප්‍රකාශ කර ඇත. සම්මුඛ පරීක්ෂණය අවස්ථාවේ දී සම්මුඛ පරීක්ෂණ මණ්ඩයේ සිටි නිලධාරීන් සිංහල භාෂාවෙන් පමණක් කතා කළ බැවින් තම දියණියට එම නිලධාරීන් විසින් විමසන ලද ප්‍රශ්න සඳහා පිළිතුරු ලබාදීමට නොහැකි වූ බවත්, තමා විසින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නිලධාරීන් වෙත තම දියණියට දෙමළ භාෂාව සහ ඉංග්‍රීසි භාෂාව කතා කළ හැකි නමුත් සිංහල භාෂාව නොතේරෙන බව ප්‍රකාශ කළ බවත්, එම නිලධාරීන් දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා දෙකම නොදන්නා බැවින් දැරියට එම නිලධාරීන් සමග කතා කිරීමට නොහැකි වූ බවත් සඳහන් කර ඇත. තවද සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී දැරියගේ වෛද්‍ය වාර්තා සහ පාසලේ විදුහල්පතිතුමිය විසින් ලබාදී තිබූ ලේඛන එම සම්මුණ පරීක්ෂණ මණ්ඩලයේ නිලධාරීන්ගේ අවධානයට යොමුකර ඇති නමුත්, සම්මුඛ පරීක්ෂණ මණ්ඩය විසින් තම දැරියගේ අවශ්‍යතාවය පිළිබඳව අවධානය යොමු නොකරන බව තමාට හැඟී ගිය බැවින් තමා විසින් සිය දියණිය පාසලේ දී වාර විභාග සඳහා පිළිතුරු සපයන ආකාරය පිළිබඳව කරුණු ඉදිරිපත් කරමින් මෙවර සාමාන්‍ය පෙළ විභාගය සඳහා පෙනී සිටීමට අවශ්‍ය සහනය කුමක්ද යන්න සම්බන්ධයෙන් එම අවස්ථාවේදී ම වාචිකව මෙන්ම ලිඛිතව ද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරමින් දෙමළ භාෂාවෙන් කතා කළ හැකි නිලධාරි නැද්ද යන්න විමසා ඇති බවත් පැමිණිලිකරු විසින් සඳහන් කර ඇත. එවිට සම්මුඛ පරීක්ෂණ නිලධාරීන් තමා වෙනත් උසස් නිලධාරියෙකු වෙත යොමු කළ බවත් එම නිලධාරියා විසින් වෛද්‍ය වාර්තාව ඇතුළුව අදාළ ලේඛන සියල්ල පරීක්ෂා කර, පැමිණිලිකරුගේ ඉල්ලීම අයදුම්පතෙහි සඳහන් කර අවශ්‍ය පහසුකම් ලබාදීමට නිර්දේශ කරන ලෙසට උපදෙස් ලබාදුන් බව

පැමිණිලිකරු විසින් ප්‍රකාශ කර ඇත. තවද තමා ඉදිරියේම සම්මුඛ පරීක්ෂණ නිලධාරීන් විසින් සටහන් යෙදුව ද එය කුමක්ද යන්න තමා නොදන්නා බවත්, සම්මුඛ පරීක්ෂණ මණ්ඩයේ තීරණ එම අවස්ථාවේදී තමාට ලබානොදෙන බව සහ විභාග දෙපාර්තමේන්තුව විසින් ශාලාධිපතිට හා අදාළ විදුහල්පති වෙත ලිඛිතව දැනුම්දෙන බවට ප්‍රකාශ කර ඇති බව සඳහන් කර ඇත.

අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය 2024.05.06 වන දින ආරම්භවීමට නියමිතව තිබූ බවත් ඒ වන තෙක් තමාට හෝ පාසලට විභාග දෙපාර්තමේන්තුව විසින් ඉහත සඳහන් පරිදි ලිඛිත දැනුම්දීමක් සිදු නොකළ බැවින් පැමිණිලිකරු 2024.05.03 දින විභාග දෙපාර්තමේන්තුව වෙත ගොස් මේ පිළිබඳව විමසීමක් කළ බවත්, එකී විමසුමට අනුව සිංහල භාෂාවෙන් නිකුත් කරන ලද ලිපියක් තමාට එහිදී ලබාදුන් බවත් සඳහන් කර ඇත. තමා සිංහල භාෂාව කියවීමට නොදන්නා බැවින් නිවසට පැමිණ එය පරිවර්තනය කර ගත් පසු, එම ලිපියෙහි තමාගේ විශේෂ අවශ්‍යතා සහිත දරුවාට අවශ්‍ය කිසිදු සහනයක් සඳහන් වී නොමැති බව දැනගත් බවත් ඒ පිළිබඳව නැවත විමසීමට සිදුවන්නේ විභාගය ආරම්භ කරන දින එනම් 2024.05.06 වන දිනවන බැවින් ඒ වන තෙක් සිටි බව සඳහන් කර ඇත. ඒ අනුව තමා දරුවා සමග 2024.05.06 දින කොළඹ මෙතෝදිස්ත විද්‍යාලයේ විභාග මධ්‍යස්ථාන අංක 0108 වෙත ගිය පසු එහි ශාලාධිපති වන තෙවන වගඋත්තරකරු වන ඒ. හේමානන්ත් මයා වෙතින් තමා ඉල්ලා සිටින සහන ලබාදෙන මෙන් දන්වා විභාග දෙපාර්තමේන්තුව විසින් ලිපියක් ලැබී තිබේද යන්න විමසීමේ දී, එවැනි ලිපියක් ලැබී නොමැති බවත්, යොමුකර ඇති ලිපියෙහි සඳහන් සහන වලට පරිබාහිර කිසිදු සහනයක් ලබාදිය නොහැකි බවත් තෙවන වගඋත්තරකරු වන ශාලාධිපති විසින් ප්‍රකාශ කළ බව සඳහන් කර ඇත.

පසුව තමා විසින් මෙතෝදිස්ත පාසලේ විදුහල්පතිනිය වෙත ගොස් විමසීමේ දී පාසලට ද එවැනි ලිපියක් ලැබී නොමැති බව දැන් වූ පසු, සිය දියණිය විභාගයට වාඩිකරවා තමා විභාග දෙපාර්තමේන්තුව වෙත ගිය බව ප්‍රකාශ කර ඇත. විභාග දෙපාර්තමේන්තුවට ගිය අවස්ථාවේදී නියෝජ්‍ය විභාග කොමසාරිස් ඩී. එන්. එස්. අතුකෝරාල මහතා හමුවූ බවත් එම නිලධාරියා විසින් ද ලිපියේ දක්වා නොමැති කිසිදු සහනයක් ලබාදිය නොහැකි බවත් එම අවස්ථාවේදී කිසිවක් කළ නොහැකි අතර කමිටුවට යොමුකර තීරණයක් ගත යුතු බව ප්‍රකාශ කළ බව පැමිණිලිකරු සඳහන් කර ඇත. එම අවස්ථාවේදී එම ස්ථානයේ දෙමළ භාෂාවෙන් කතා කරන නිලධාරිනියක් දුටු බැවින් තමා එම නිලධාරිනියට ද කරුණු පැහැදිලි කළ ද තමාට එම නිලධාරිනියගෙන් ද පෙර පිළිතුරම ලැබුණු බැවින් සහ කිසිදු නිලධාරියෙක්ගෙන් තමාට සාධාරණයක් ඉටුනොවූ බැවින් තමා විභාග කොමසාරිස් ජනරාල් හමුවීමට අවසර ලබාදෙන මෙන් ඉල්ලා සිටිය ද ඊට ද අවස්ථාව නොලැබුණු බව සඳහන් කර ඇත. මෙම සිදුවීම හේතුවෙන තම දියණිය සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටිය ද දියණිය එතෙක් හුරුවී තිබූ ක්‍රමවේදයට අනුව විභාගයට මුහුණදීමට නොලැබුණු බැවින් ප්‍රශ්න පත්‍රය සඳහා නිසියාකාරව පිළිතුරු ලිවීමට නොහැකි වූ බවත්, විභාගය අවස්ථාවේදී සිය දියණිය බියට පත්ව වී සිටි බවත් ප්‍රකාශ කර ඇත. තවද, 2024.05.06 වන දින තම දියණිය හින්දු විෂය සඳහා පෙනී සිටි බවත්, එදින දියණිය විභාගය ලියන ස්ථානයේ නිරීක්ෂකවරයෙක් වාඩිවී සිටීම පමණක්

සිදු කළ බවත් ප්‍රකාශ කර තිබේ. එහෙත් දෙමළ විෂය තිබූ දින එනම් 2024.05.07 දින තමාට ලබාදී තිබූ උපදෙස් පත්‍රිකාව අනුව දරුවා විභාග ශාලාව වෙත රැගෙන ගොස් වාඩිකරවීමට හෝ පළමුවන වගඋත්තරකරු වන ශාලාධිපති ඒ. හේමානන්ත් මයා අවසර ලබා නොදුන් බවත්, දරුවා ජේනමානයේ සිටීමට හෝ අවසර ලබානොදුන් බවත් ප්‍රකාශ කර ඇත. එමෙන්ම දරුවාගේ රෝගී තත්ත්වය අනුව දරුවාට වරින්වර නින්ද යන බැවින් දරුවා සමීපයේ සිටින නිරීක්ෂකයා විසින් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු ලිවීම සඳහා දරුවා උනන්දුකරවිය යුතු බවට උපදෙස් පත්‍රිකාවේ උපදෙස් ලබාදී තිබුණ ද, එසේ සිදුකර ඇද්ද යන්න තමාට සැක සහිත බවත් ප්‍රකාශ කර තිබේ. එයට හේතුව දරුවාගේ විභාග ප්‍රතිඵල අනුව හින්දු විෂයට "එස් සාමාර්ථයක්" ලැබී තිබූ නමුත්, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් අසමත්වී තිබීම බව වැඩිදුරටත් සඳහන් කර ඇත. ඒ අනුව තමාට ලබාදී තිබූ උපදෙස් පත්‍රිකාවේ සඳහන් සහනයවත් ලබාදීමට පළමුවන වගඋත්තරකරු වන ශාලාධිපති ඒ. හේමානන්ත් මයා කටයුතු නොකළ බව පැමිණිලිකරු ප්‍රකාශ කර තිබේ. 2024.05.17 දින මානව හිමිකම් කොමිෂන් සභාවේදී මෙකී පැමිණිල්ල විභාගයට ගත් අවස්ථාවේදී ඒ සඳහා පැමිණි විභාග කොමසාරිස්තුමන් විසින් තමාට සිදුවූ අසාධාරණය සම්බන්ධයෙන් අභියාචනයක් ඉදිරිපත් කරන ලෙසත්, ඒ පිළිබඳව සොයාබලා සහනයක් ලබාදීමට කටයුතු කරන බව පැමිණිලිකරුට දන්වා සිටිය ද, 2024.05.22 දින තමා විසින් යොමුකරන ලද අභියාචනයට මෙතෙක් කිසිදු පිළිතුරක් ලබාදී නොමැති බව වැඩිදුරටත් සඳහන් කර ඇත. කෙසේනමුත් මෙම සිදුවීම හේතුවෙන් තම දියණියට සිදුවූ අසාධාරණයට සාධාරණයක් ඉටුකරදෙන මෙන් මානව හිමිකම් කොමිෂන් සභාවෙන් ඉල්ලා සිටින බව පැමිණිලිකරු වැඩිදුරටත් සඳහන් කර ඇත.

වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :

ඉහත සඳහන් කරන ලද පැමිණිල්ල ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 2024.05.16 වන දින පැමිණිල්ල විභාගයට ගත් අතර එදින වගඋත්තර පාර්ශවය සහභාගී නොවූ බැවින් 2024.05.17 වන දින නැවත කැඳවන ලදි. එහිදී වගඋත්තර පාර්ශවය විසින් කොමිෂන් සභාව ඉදිරියේ පහත පරිදි ප්‍රකාශ ලබාදෙන ලදි.

**පළමුවන වගඋත්තරකරු - විභාග කොමසාරිස් ජනරාල් (විභාග දෙපාර්තමේන්තුව)**

2024.05.17 වන දින පැමිණිල්ල විභාග කිරීම සඳහා කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටි විභාග කොමසාරිස් ජනරාල් එච්. ජේ. එම්. සී. ඒ. ජයසුන්දර මහතා පහත පරිදි ප්‍රකාශයක් ලබාදී ඇත. HRC/HO/1915/24 දරණ පැමිණිල්ලෙහි අගතියටපත් පාර්ශවය වන ගජේන්ඩා ගනේශ්වරන් යන දැරියගේ දෙමාපියන් 2024.05.06 වන දින විභාග දෙපාර්තමේන්තුවේ දී තමා හමුවාද යන්න සම්බන්ධයෙන් නිවැරදි මතකයක් තමාට නොමැති අතර, එදින අධික ලෙස කාර්යබහුල දිනයක් වූ බැවින් කිසියම් හේතුවෙකින් තමා හමුවීමට එම පාර්ශවයන්ට නොහැකි වූයේ නම් ඒ සම්බන්ධයෙන් කණගාටුව

ප්‍රකාශ කරන බව සඳහන් කර ඇත. මෙවැනි විශේෂ අවශ්‍යතා සහිත දරුවන් විභාගයට පෙනී සිටීමේදී බ්‍රේල් මාධ්‍ය ඔස්සේ පිළිතුරු ලිවීම සඳහා පහසුකම් සපයා දීම සිදුකරන බවත්, වාචිකව පිළිතුරු ලබාදීම සඳහා ක්‍රමවේද දෙකක් පවතින අතර, එහිදී අන්ධභාවයට පත්වූ දරුවන් සඳහා ප්‍රශ්න පත්‍රය කියවීම සඳහා ගුරුවරයෙක් ලබාදෙන අතර දරුවා බ්‍රේල් ක්‍රමවේදය ඔස්සේ පිළිතුරු ලිවීම සිදුකරනු ලබන බවත් සඳහන් කර ඇත. ඒ අනුව මෙම දැරිය සම්බන්ධයෙන් පැමිණිලි පාර්ශවය ඉදිරිපත් කරනු ලබන ආකාරයේ ප්‍රශ්න පත්‍රය ලිවීම සඳහා කෙනෙක් ලබාදීමේ පහසුකමක් දෙපාර්තමේන්තුව විසින් සපයා නොමැති බව සඳහන් කර ඇත. තවද විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ට අවශ්‍ය පහසුකම් සලසා දෙන ලෙසට අදාළ විභාග මධ්‍යස්ථානයේ ශාලාධිපති වෙත ලිඛිතව දැනුම්දීම සිදුකරන අතර, එකී ලිපි මෙතෙක් සිංහල මාධ්‍යයෙන් යොමුකරනු ලැබූ බවත්, එහෙත් මේවන තෙක් ඒ සම්බන්ධයෙන් කිසිදු ගැටලුවක් වාර්තා වී නොමැති බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත. කෙසේ නමුත් දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබන්නේ විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ට විභාගයට මුහුණදීමේ දී පවතින බාධා ඉවත් කිරීම පමණක් බවත්, ගජේන්ඩා ගනේශ්වරන් දැරිය සම්බන්ධයෙන් ගැටලුවක් මතුවී තිබේද යන්න විමර්ශනය කර සහනයක් ලබාදීමට අවශ්‍ය පියවර ගත හැකි බව සඳහන් කර ඇත.

විභාග දෙපාර්තමේන්තුව වෙනුවෙන් පෙනී සිටි නියෝජ්‍ය විභාග කොමසාරිස් ජනරාල් ඩී. එන්. එස්. අතුකෝරල මහතා කොමිෂන් සභාව වෙත පහත පරිදි ප්‍රකාශයක් ලබාදී ඇත. විශේෂ අවශ්‍යතා සහිත දරුවන් විභාගයට මුහුණදීමේ දී ඔවුන් සඳහා ලබාදිය යුතු පහසුකම් සම්බන්ධයෙන් පරික්ෂා කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණයක් පවත්වන අතර එම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සඳහා විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සම්බන්ධයෙන් දැනුම සහ පුහුණුව ලත් නිලධාරීන් පත්කරනු ලබන බව සඳහන් කර ඇත. ඇතැම් දරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා රැගෙන ඒමට නොහැකි අවස්ථාවන් වලදී එම දරුවන්ගේ නිවෙස් වලට ගොස් විමර්ශන කර වාර්තා කිරීම සිදුකරනු ලබන බව සඳහන් කර ඇත. සම්මුඛ පරීක්ෂණය සඳහා පෙනී සිටින අවස්ථාවේදී දරුවා සම්බන්ධයෙන් වූ වෛද්‍ය වාර්තා ඇතුළු අනෙකුත් ලේඛන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු බව දරුවන්ගේ භාරකරුවන් වෙත පූර්ව දැනුම්දීමක් සිදුකරනු ලබන බව සඳහන් කර ඇත. සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී දරුවන් සමග මෙන්ම දෙමාපියන් සමග ද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සාකච්ඡා කරන බවත් එම අවස්ථාවේදී ඉල්ලුම් පත්‍රයක් ලබාදෙන බවත් එය දරුවාගේ භාරකරුවන් විසින් සම්පූර්ණ කළ යුතු බවත් සඳහන් කර ඇත. තවද සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් දරුවාට ලිවීමට, කියවීමට හැකියාව පවතී ද යන්න පරික්ෂා කරනු ලබන බවත් සඳහන් කර ඇත. මෙම දැරියට විභාගයට පෙනී සිටීම සඳහා ගුරුවරුයෙකු ලබාදෙන ලෙසට 2024.05.06 වන දින එනම් සාමාන්‍ය පෙළ විභාගය ආරම්භ කළ දින පැමිණිලිකරු විසින් ඉල්ලීමක් සිදුකර ඇති බවත් ප්‍රකාශ කර ඇත. මෙම ගැටලු සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා විභාග කොමසාරිස් ජනරාලතුමා විසින් සමාලෝචන කමිටුවක් පත් කරනු ලබන බවත්, එම කමිටුව මගින් ශ්‍රී ලංකාව තුළ විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සම්බන්ධයෙන් පවත්වන ලද සියලුම සම්මුඛ පරීක්ෂණ

මණ්ඩල සම්බන්ධයෙන් සොයාබලන බවත් සඳහන් කර ඇත. මෙම දැරිය සහභාගී වූ සම්මුඛ පරීක්ෂණය කොළඹ කලාපයේ පවත්වා ඇති අතර, කොළඹ කලාපයේ දෙමළ පාසල් ඇති බැවින් දෙමළ මාධ්‍යයෙන් කමිටුවක් සහ සිංහල මාධ්‍යයෙන් කමිටු 04 ක් පත් කර ඇති බවත් සඳහන් කර ඇත. එම කමිටු මගින් දරුවන්ගේ වෛද්‍ය වාර්තා සම්බන්ධයෙන් විශේෂයෙන් අවධානය යොමුකරනු ලබන අතර, මෙම අය සම්බන්ධයෙන් සලකා බැලීමේදී මෙම දැරියගේ වෛද්‍ය වාර්තා පාසල වෙත ලබාදී ඇති නමුත් විභාග දෙපාර්තමේන්තුව වෙත ලබාදී නොමැති බව සඳහන් කර ඇත. එමෙන්ම කිසිදු නිලධාරියෙක් හෝ මණ්ඩලයක් තනි තීරණයක් නොගන්නා බවත් මෙම ගැටලුව සම්බන්ධයෙන් අභියාචනා මණ්ඩලයක් පත් කර ඇති බවත් සඳහන් කර ඇත.

**දෙවන වගඋත්තරකරු - ඒ. හේමානන්ත් මයා (ශාලාධිපති) කොළඹ මෙතෝදිස්ත විද්‍යාලය මධ්‍යස්ථාන අංක 0108**

ඉහත වගඋත්තරකරු 2025.05.22 / 2025.06.20 යන දිනයන්හිදී කොමිෂන් සභාව වෙත කැඳවන ලද නමුත් ඔහු වෙනුවෙන් නීතිඥ නියෝජනයක් පමණක් ලබාදී ඇත. ස්වභාවික යුක්ති මූලධර්මය අනුව මෙම වගඋත්තරකරුට ප්‍රකාශයක් ලබාදීම සඳහා නැවත 2025.07.15 දින කැඳවන ලද නමුත් එම අවස්ථාවට ද සහභාගී වී නොමැත. ඒ සම්බන්ධයෙන් වැඩිදුරටත් විමසීම සඳහා 2025.10.02 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම කොමිෂන් සභාව විසින් මෙම වගඋත්තරකරු සේවය කරනු ලබන කොළඹ හෝලි රොසරි දෙමළ විද්‍යාලයේ වැඩ බලන විදුහල්පතිතුමිය වන කේ. අම්බිකා මිය දුරකථන මාර්ගයෙන් සම්බන්ධ කර ගන්නා ලදි. එහිදී එතුමිය විසින් ඒ. හේමානන්ත් මයා මිය ගොස් ඇති බව දන්වා සිටින ලදි.

**සාක්ෂි විමසීම :-**

**එච්. ජී. ප්‍රනාන්දු මිය - විදුහල්පති, කො/මෙතෝදිස්ත විද්‍යාලය**

පැමිණිල්ලේ අගතියට පත් ගජේන්ඩා ගනේශ්වරන් ශිෂ්‍යාව අධ්‍යාපනය හදාරන ලද කො/මෙතෝදිස්ත විද්‍යාලයේ විදුහල්පති එච්. ජී. ප්‍රනාන්දු මිය 2024.05.17 දින කොමිෂන් සභාව ඉදිරියේ පහත පරිදි ප්‍රකාශයක් ලබාදී ඇත. මෙම ශිෂ්‍යාව තම පාසලේ දෙමළ මාධ්‍යයෙන් ඉගෙනුම් කටයුතු හදාරණ බවත් 2012 වසරේ සිට තම පාසලේ විශේෂ අධ්‍යාපන ඒකකයේ අධ්‍යාපනය හදාරණ බවත් ප්‍රකාශ කර ඇත. 2019 වසරේ දී රිජ්වේ ආර්යා ළමා රෝහල විසින් මෙම දැරිය පසුගාමී වර්ධනයක් සහ සෙමෙන් මනස වැඩෙන දරුවෙකු වශයෙන් හඳුනාගෙන තිබූ අතර, 2024 වසරේදී ආබාධිත දරුවන් සඳහා වූ ජාතික මධ්‍යස්ථානයේ වෛද්‍යාවරු විසින් මෙම දැරිය ඉගෙනුම් ආබාධ සහිත රෝගයෙන් පෙළෙන දැරියක් බවට විනිශ්චය කර තිබූ බව ප්‍රකාශ කර ඇත. මෙම දැරිය සඳහා හය වසරේ සිට පාසලේ පවත්වන ලද වාර විභාග සඳහා ගුරුවරියන් දෙදෙනෙකුගේ සහය සහිතව ප්‍රශ්න පත්‍රය කියවීමට හා ලිවීමට අවස්ථාව

ලබාදුන් බවත්, ඊට අමතරව සාමාන්‍ය විභාග කාලසීමාවට වඩා විනාඩි 10 ක අමතර කාලයක් ලබාදීම ද සිදු කර ඇති බව ප්‍රකාශ කර තිබේ. 2023(2024) අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය සඳහා අයදුම් කිරීමේදී මෙම ශිෂ්‍යාව විශේෂ අවශ්‍යතා සහිත දරුවෙකු බව තහවුරු කිරීම සඳහා තමා විසින් 2024.04.08 දිනැතිව විභාග දෙපාර්තමේන්තුව වෙත ලිඛිතව දැනුම්දෙමින් වෛද්‍ය නිර්දේශිත විශේෂ විභාග පහසුකම් සලසාදෙන ලෙසට ඉල්ලීමක් සිදු කළ බව ප්‍රකාශ කර ඇත. එකී ඉල්ලීම් ලිපිය මගින්, සෑම විෂයක් සඳහාම පැය 01 ට විනාඩි 10 බැගින් අමතර කාලයක් ලබාදීම, නිදහස් නිශ්ශබ්ද සාමකාමී විභාග පරිසරයක් සහිත විභාග කාමරයක් ලබාදීම, ප්‍රශ්න කියවීමට හා දරුවා ලබාදෙන පිළිතුරු ලිවීමට කෙනෙකු පත් කිරීම යන සහන අතුළත් නිර්දේශිත විභාග සහන ලබාදෙන මෙන් ලිපියෙහි සඳහන් කර තිබූ බව වැඩිදුරටත් ප්‍රකාශ කර තිබේ. තවද අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය 2024.05.06 දින ආරම්භ වූ අතර, විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ට විභාගය පවත්වන ලද අවස්ථාවේදී සහන සැලසීම සඳහා පැවති සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ තීරණය සම්බන්ධයෙන් වූ දැනුවත් කිරීමේ ලිපිය පාසල වෙත ලැබී ඇත්තේ 2024.05.10 වන දින බවත් ඒවන විටත් මෙම දැරිය මුහුණදෙනු ලබන විෂයන් කිහිපයක්ම අවසන්වී තිබූ බවත් ප්‍රකාශ කර ඇත. තම පාසල තුළින් විශේෂ අවශ්‍යතා සහිත දරුවන් දෙදෙනෙකු සාමාන්‍ය පෙළ විභාගය සඳහා ඉදිරිපත් වූ බවත් එම දරුවන් දෙදෙනා අතරින් මෙම දැරිය සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමුවිය යුතුව පැවති බව වැඩිදුරටත් ප්‍රකාශ කර තිබේ.

ප්‍රගතිය විමසීම :-

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ඉහත සඳහන් පැමිණිලි තුන සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් 2024.06.18 දිනැතිව මානව හිමිකම් කොමිෂන් සභාව වෙත යොමුකරන ලද වාර්තාව මගින් ඉහත පැමිණිලි තුන සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු ඉදිරිපත් කර තිබේ. එකී වාර්තාව මගින් විභාග කොමසාරිස් ජනරාල් ප්‍රකාශ කර ඇත්තේ, උක්ත සිද්ධීන් මුල් කොට ගනිමින් විභාග අපේක්ෂකයින්ට අගතියක් සිදුවී ඇත්නම්, ඒ සඳහා ලබාදිය හැකි සහන නිර්දේශ කිරීම සඳහා තමා කමිටුවක් පත් කරන ලද බවත්, එම කමිටු නිර්දේශ ප්‍රකාරව පහත පරිදි සහන ලබාදීමට කටයුතු කරන බවත් ය. ඒ අනුව මෙම පැමිණිල්ලේ අගතියටපත් පාර්ශවය වන ජී. ගනේෂ්වරන් අයදුම්කාරිය අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සඳහා දෙමළ භාෂාව හා සාහිත්‍ය, ඉංග්‍රීසි භාෂාව සහ සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය යන විෂයන් තුන සඳහා පෙනී සිට ඇති අතර, මෙම අපේක්ෂිකාවට විශේෂ අවශ්‍යතා කමිටුව මගින් ප්‍රශ්න පත්‍රය කියවීම සඳහා නිරීක්ෂකයෙකු නිර්දේශ නොකිරීම හේතුවෙන් සිදුවූ අගතිය තුලනය කිරීම සඳහා පෙනී සිටින ලද විෂයන් තුන සඳහා අපේක්ෂිකාව ලියා ඇති පිළිතුරු පදනම් කරගෙන උත්තර පත්‍ර ඇගයීම් අවස්ථාවේදී ඒ සඳහා විශේෂඥ දැනුමක් සහිත කමිටුවක් හරහා සහනයක් ලබාදීමට තීරණය කර ඇති බව වාර්තාවේ සඳහන් වේ.

තවද ඉහත සිදුවීම සම්බන්ධයෙන් අගතියට පත් විභාග අපේක්ෂිකාවට දෙනු ලබන සහනයන්ට අමතරව ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් ඇතිවීම වැළැක්වීම සඳහා පහත තීරණ ද ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව වැඩිදුරටත් දන්වා ඇත. ඒ අනුව,

- විශේෂ අවශ්‍යතා විභාග අපේක්ෂකයන් සඳහා පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණ වඩා විධිමත්ව පැවැත්වීමට කටයුතු කිරීම සහ අදාළ නිර්දේශ ලබාගැනීමට විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීම.
- විශේෂ අවශ්‍යතා සම්බන්ධව අදාළ පාර්ශවයන් දැනුවත් කිරීමේ ලේඛන අපේක්ෂකයින්ගේ භාෂා මාධ්‍ය අනුව යොමු කිරීමට අවශ්‍ය ඉදිරි පියවර ගැනීම.
- මෙම සිද්ධියට අදාළව නොසැලකිලිමත් ලෙස සහ නීත්‍යානුකූල ක්‍රමවේදයෙන් බැහැරව කටයුතු කරන ලද විභාග කාර්ය මණ්ඩල සාමාජිකයන් සඳහා අවවාද ලිපි නිකුත් කිරීම සහ ඉදිරි විභාග සම්බන්ධව තහනම් පැනවීමට කටයුතු කිරීම.

යනාදී ක්‍රියාමාර්ග ගැනීමට නියමිත බව වාර්තාවේ සඳහන් කර තිබේ.

**නිරීක්ෂණ :**

- විශේෂ අවශ්‍යතා සහිත දරුවන් විභාගයට මුහුණ දීම සම්බන්ධයෙන් විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ වලදී, සම්මුඛ පරීක්ෂණ මණ්ඩල නිලධාරීන් විසින් එම දරුවන් සම්බන්ධයෙන් නිවැරදිව අවධානයක් යොමුකර නොමැති බව, මෙම පැමිණිල්ලේ අගතියටපත් පාර්ශවය වන ගජේන්ඩා ගනේශ්වරන් යන සිසුවිය පිළිබඳ වූ පැමිණිල්ල විමර්ශනයේදී නිරීක්ෂණය විය.
- සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් මෙම සිසුවියගේ භාෂා දැනුම පිළිබඳව අවධානය යොමු නොකිරීම හා දෙමළ භාෂාවෙන් පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් වෙත යොමු කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් බලාපොරොත්තු වූ සහන නොලැබීමෙන්, එම සිසුවිය එතෙක් විභාගයට මුහුණදුන් රටාව වෙනස්වී දැඩි මානසික අපහසුතාවයකට ලක්වීමට සිදුවී ඇත.
- මෙම පැමිණිල්ලේ වගඋත්තර පාර්ශවය වන කොළඹ මෙතෝදිස්ත විද්‍යාලයේ මධ්‍යස්ථාන අංක 0108 ශාලාධිපති ලෙස කටයුතු කළ ඒ. හේමානන්ත් මයා මෙම විශේෂ අවශ්‍යතා සහිත සිසුවිය සම්බන්ධයෙන් කටයුතු කර ඇති ආකාරය පිළිබඳව නිරීක්ෂණයේදී, මෙම දරුවා සම්බන්ධයෙන් නිකුත් කර ඇති උපදෙස් පත්‍රිකාව මත පදනම්ව, මීට පෙර එම දරුවා විභාගයට මුහුණදුන් ක්‍රමවේදය පිළිබඳව සංවේදී නොවී ක්‍රියාකිරීම හේතුවෙන් වන මෙම දැරිය විභාග අවස්ථාවේදී අගතියට පත්වී ඇත. විභාග දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද උපදෙස් පත්‍රිකාවේ දෙමාපියන්ට අයදුම්කරු අසුන්ගැන්වීම සඳහා විභාග ශාලාවට පැමිණීමට අවසරදෙන ලෙස

සඳහන් කර තිබුණ ද පැමිණිලිකරු ප්‍රකාශ කරන ආකාරයට තම දරුවා එසේ අසුන්ගැනීමට පළමු දින හැර අනෙක් දින දෙකේදී ශාලාධිපති විසින් දෙමාපියන්ට අවසර ලබාදී නොමැත. ඒ අනුව දෙවන වගඋත්තරකරු වන ඒ. හේමානන්ත් මයා විසින් උපදෙස් පත්‍රිකාවේ ලබාදී තිබූ සහන හෝ මෙම දරුවාට ලබාදීමට සංවේදීවී නොමැති බව නිරීක්ෂණය වේ.

- තවද, මෙම සිසුවිය සම්බන්ධයෙන් එම සිසුවියගේ දෙමාපියන් ලබාදී ඇති ප්‍රකාශය අනුව, 2024.05.06 වන දින හින්දු විෂය සඳහා පෙනී සිට ඇති අතර, එදින දියණිය විභාගයට මුහුණදෙන ස්ථානයේ නිරීක්ෂකවරයෙක් දියණිය ආසන්නයේ වාඩිවී සිටි බවට දැකගත හැකි වූ බව පැමිණිලිකරු සඳහන් කර ඇත. එහෙත් මෙම සිසුවියගේ රෝගී තත්ත්වය අනුව දරුවාට වරින්වර නින්ද යන බැවින් දරුවා සමීපයේ සිටින නිරීක්ෂකයා විසින් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු ලිවීම සඳහා දරුවා උනන්දුකරවිය යුතු බවට උපදෙස් පත්‍රිකාවේ උපදෙස් ලබාදී තිබුණ ද, එසේ සිදුකර ඇද්ද යන්න පැමිණිලි පාර්ශවයට සැක සහිත බවත්, එයට හේතුව දරුවාගේ විභාග ප්‍රතිඵල අනුව හින්දු විෂයට "එස් සාමාර්ථයක්" ලැබී තිබූ නමුත්, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් අසමත්වී තිබීම බව සඳහන් කර ඇත. ඒ අනුව උපදෙස් පත්‍රිකාවේ දක්වා තිබූ සහනයවත් මෙම සිසුවියට ලබාදීමට දෙවන වගඋත්තරකරු වන ශාලාධිපති ඒ. හේමානන්ත් මයා කටයුතු කර නොමැති බව පැමිණිලිකරු ප්‍රකාශ කර තිබේ. එමගින් පෙනී යන්නේ, ශාලාධිපති ලෙස දෙවන වගඋත්තරකරු සිය රාජකාරී නිසි ලෙස ඉටුකර නොමැති බවයි. විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී වඩා සැලකිල්ලෙන් හා වගකීමෙන් සහ සංවේදීභාවයකින් යුතුව ශාලාධිපතිවරයෙකු කටයුතු කළ යුතු වුවද, ඒ. හේමානන්ත් මයා සිය වගකීම් නිසි ලෙස ඉටු කර නොමැති බව නිරීක්ෂණය වේ. මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් විභාග දෙපාර්තමේන්තුවෙන් පවත්වන ලද පරීක්ෂණයේ ප්‍රතිඵලයක් ලෙස මෙම නිලධාරියා වෙත විභාග තහනමක් ද දඬුවම ලෙස ලබාදී තිබීමෙන් ඉහත කරුණ තවදුරටත් තහවුරු වේ.

- එමෙන්ම මෙම සිසුවිය සම්බන්ධයෙන් එම සිසුවිය විභාග දෙපාර්තමේන්තුවෙන් පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයට මුහුණදුන් අවස්ථාවේදී දෙමළ භාෂාවෙන් පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයකට යොමුකර නොමැති අතර, සහභාගී වූ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සිටි නිලධාරීන් විසින් මෙම දැරිය සම්බන්ධයෙන් සංවේදීම කටයුතු කර නොමැති බව විමර්ශනයේදී නිරීක්ෂනය විය. එනම්, අයදුම්කරුගේ පවතින ඌණතා පැහැදිලි කර පාසල් වාර විභාග වලදී අනුගමනය කරන ලද ක්‍රමවේදය සහ ලබාදීමට නිර්දේශ කරන යෝජනා ඇතුළත් ලිපියක් පාසලේ විදුහල්පතිගේ නිර්දේශය සහිතව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ලබාදෙන ලෙස දැනුම්දී තිබූ බැවින්, 2024.08.04 දිනැතිව මෙතෝදිස් විද්‍යාලයේ විදුහල්පතිගේ අත්සනින් යුතුව, "ප්‍රශ්න කියවීම සහ දරුවා ලබාදෙන පිළිතුරු ලිවීමට කෙනෙකු පත් කරන ලෙස" සහ තවත් ඉල්ලීම් දෙකක් සහිතන නිර්දේශිත ලිපියක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට යොමුකර තිබුණ ද, ඒ පිළිබඳව

සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය අවධානය යොමු නොකිරීම සහ සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී දෙමළ භාෂා පරිවර්තකයෙකු හෝ ලබානොදීමේ ප්‍රතිඵලයක් ලෙස, මෙම සිසුවියට අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයට මුහුණදීමේදී අපේක්ෂිත සහන රහිතව උපදෙස් පත්‍රිකාවක් නිකුත් කර ඇති බව පෙනීයයි. ඒ අනුව ගජේන්ඩා ගනේශ්වරන් යන සිසුවිය සම්බන්ධයෙන් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ද, විභාගයට මුහුණදෙන අවස්ථාවේදී ශාලාධිපති විසින් ද සංවේදීභාවයකින් තොරව කටයුතු කිරීම හේතුවෙන් සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ සිටම අගතියට පත්ව ඇති බව පෙනීයයි.

- සියලුම කරුණු නිරීක්ෂණය කිරීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් 2023/2024 අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේදී විශේෂ අවශ්‍යතා සහිත සිසුන් සම්බන්ධයෙන් අනුගමනය කර ඇති ක්‍රියාපටිපාටිය තුළ දෝෂ බොහෝමයක් පවතින බව කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ. විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සම්බන්ධයෙන් විභාග පැවැත්වීම සඳහා පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ වලදී, එහි කාර්යය මණ්ඩලය සම්බන්ධයෙන් හා එහිදී අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය සම්බන්ධයෙන් නියාමනයක් සිදුවී නොමැති බව පෙනීයයි. මේ හේතුවෙන් විශේෂ අවශ්‍යතා සහිත සිසුන් සඳහා උපදෙස් පත්‍රිකා නිකුත් කිරීමේදී එම සිසුන් ඉල්ලීම් කරන ලද සහන නොලැබීම හේතුවෙන් විභාග අවස්ථාවේදී සිසුන් විශාල ලෙස අගතියට පත්ව ඇති බව නිරීක්ෂණය වේ. මේ පිළිබඳ පූර්ණ වගකීම විභාග දෙපාර්තමේන්තුව සතුවන බව පෙනීයයි.

**නිගමනය :**

උක්ත පැමිණිල්ල සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ඉදිරිපත්වී ඇති සියලුම කරුණු විමර්ශනය කිරීමෙන් පසු, පැමිණිල්ලේ අගතියටපත් පාර්ශවය වන ගජේන්ඩා ගනේශ්වරන් සිසුවියගේ මූලික අයිතිවාසිකම් කඩකිරීම සම්බන්ධයෙන්, සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ සිට උපදෙස් පත්‍රිකාව නිකුත් කිරීම තෙක් විභාග දෙපාර්තමේන්තුව වගකිව යුතු බව ද, කොළඹ මෙතෝදිස්ත විද්‍යාලය මධ්‍යස්ථාන අංක 0108 හි ශාලාධිපති ලෙස රාජකාරී ඉටුකළ ඒ. හේමානන්ත් මයා මෙම පැමිණිල්ලේ අගතියට පත් පාර්ශවය විශේෂ අවශ්‍යතා සහිත දරුවකු වන බවට සංවේදීභාවයකින් සහ අවබෝධයකින් කටයුතු නොකිරීම හේතුවෙන් උද්ගත වූ ගැටලුකාරී තත්ත්වයට වගකිව යුතු බව ද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබේ.

එමෙන්ම විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ අධ්‍යාපනය සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව විශේෂ චක්‍රලේඛ, විධිවිධාන, මාර්ගෝපදේශ නිකුත්කර තිබිය දී, විභාගයකට මුහුණදීමට යන මෙම විශේෂ අවශ්‍යතා සහිත ශිෂ්‍යයා මානසික පීඩනයට පත්වන ආකාරයෙන් කටයුතු කර ඇති බව ද කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ. ඒ අනුව **1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12 (1)** ව්‍යවස්ථාව මඟින් තහවුරු කර ඇති **"නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ**

ආකාවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය" යන මූලික අයිතිවාසිකම, පළමු වගඋත්තරකරු ලෙස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ද, දෙවන වගඋත්තකරු වශයෙන් ශාලාධිපති ලෙස කටයුතු කළ ඒ. හේමානන්ත් මයා විසින් ද උල්ලංඝනය කර ඇති බවට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබේ.

එමෙන්ම 1989 නොවැම්බර් මස 20 වන දින එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද "ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියෙහි" (Convention on the Rights of the Child) පාර්ශවකරුවෙකු ලෙස 1991 වසරේදී ශ්‍රී ලංකාව අත්සන් තබා ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට නෛතිකමය වශයෙන් බැඳී සිටී. තවද, 1996 අංක 28 දරණ "ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත" මගින් සහ 2016 පෙබරවාරි මස 08 වන දින "ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියට" (United Nations Convention on the Rights of Persons with Disabilities) ශ්‍රී ලංකාව අත්සන් තබමින් විශේෂ අවශ්‍යතා සහිත ප්‍රජාවගේ අයිතීන් සුරක්ෂිත කිරීමේ නෛතික රාමුව තුළ බැඳී සිටී.

ඉහත දක්වන ලද ආකාරයේ නීති රාමුවකින් බැඳී සිටින අවස්ථාවකදී, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12 (1) ව්‍යවස්ථාව සහ එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය, 1996 අංක 28 දරණ ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත සහ ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය යන නීති උල්ලංඝනය වන ආකාරයෙන් පළමුවන සහ දෙවන වගඋත්තරකරුවන් විසින් කටයුතු කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පහත පරිදි නිර්දේශ කර සිටී.

දෙවන වගඋත්තරකරු වන ඒ. හේමානන්ත් මහතා මේවන විට මියගොස් ඇති අතර, මිය යාමට පෙර මෙම සිදුවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පරීක්ෂණයක් පවත්වා එම නිලධාරියාට විභාග ශාලාධිපති රාජකාරී කටයුතු වල නිරතවීම තහනම් කර තිබූ බව විමර්ශනයේදී අනාවරණය විය.

**ලේකම් (අධ්‍යාපන අමාත්‍යාංශය) සහ විභාග කොමසාරිස් ජනරාල් විසින්,**

1. ගජේන්ඩා ගනේශ්වරන් සිසුවිය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද සම්මුඛ පරීක්ෂණයේදී, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් මෙම දරුවා මීට පෙර ශිෂ්‍යත්ව විභාගය ඇතුළු පාසලේ වාර විභාග සඳහා මුහුණදුන් ආකාරය සම්බන්ධයෙන් අවධානය යොමුනොකර නිවැරදි තක්සේරුවක් සිදුනොකිරීම හා දෙමළ භාෂාවෙන් පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් වෙත යොමු නොකිරීමේ ප්‍රතිඵලයක් ලෙස, අ.පො.ස. සාමාන්‍ය පෙළ

විභාගයට මුහුණදීමේදී මෙම සිසුවියට ලබාදිය යුතු සහන සහිත උපදෙස් පත්‍රිකාවක් නිකුත් නොකිරීම හේතුවෙන් අගතියටපත්ව ඇත. එබැවින් මෙම සිසුවියගේ සම්මුඛ පරීක්ෂණය සිදුකළ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සම්බන්ධයෙන් විමර්ශනය කර එම නිලධාරීන් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ගයක් ගත යුතු අතර, එසේ ගනු ලබන ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව දැනුවත් කළ යුතුය.

2026. 02.24 වන දිනට පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්ති ප්‍රකාරව වගඋත්තර පාර්ශවය වෙත දන්වමු.

එල්.ටී.බී. දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (හිටපු)
සභාපති.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත :-

01. අමාත්‍යතුමා
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල. - කා.දැ.ගැ.ද

02. ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,බත්තරමුල්ල. - ඉහත නිර්දේශ ප්‍රකාරව පියවර ගැනීම